සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

GIT | S | I


පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 12 - 2019**

විභාග අංකය .............................  සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I  කාලය පැය එකයි

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

▪ **ATM යන්ත්‍රයකින් මුදල් ලබා ගන්නා ආකාරය පහත දළ සටහනේ දැක්වේ. ඒ ඇසුරින් 1 සිට 04 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**




01. මෙම පද්ධතිය මගින් අවශ්‍ය මුදල් ප්‍රමාණය ලැබීම කුමන පද්ධති සංරචකයට අයත් වේද?

i. ආදානය  ii. සැකසුම  iii. ආචයනය  iv. ප්‍රතිදානය

02. ඉහත 1 අදියර හැඳින්වීමට පහත කුමන පදය වඩාත් යෝග්‍ය වේද?

i. ආදානය  ii. සැකසුම  iii. ආචයනය  iv. ප්‍රතිදානය

03. ඉහත පද්ධතියට අනුව ආදාන හා ප්‍රතිදාන යන කාර්යයන් දෙක සඳහා භාවිත කළ හැකි උපක්‍රමයකි.

i. යතුරු පුවරුව  ii. තාප මුද්‍රකය
iii. ස්පර්ශ සංවේදී තිරය  iv. පියවු පරිපථ රූපවාහිනී කැමරාව

04. ඉහත පද්ධතියෙන් ගණුදෙනු කරුවෙකු එක් ගණුදෙනුවක් සිදු කරන අවස්ථාවේ දී පමණක් රහස් අංකය, මුදල් ප්‍රමාණය, ගිණුමේ ශේෂය ආදී දත්ත හා තොරතුරු ගබඩා කර තබා ගන්නේ කුමන මතකයේද?

i. සසම්භාවී පිවිසුම් මතකය (RAM) තුළය.  ii. පඨන මාත්‍ර මතකය (ROM) තුළය.
iii. දෘඪ තැටිය තුළය.  iv. මතක කාඩ්පත තුළය.

05 ආදාන උපාංග පමණක් ඇතුලත් පිළිතුර වන්නේ

i. මූසිකය, යතුරු පුවරුව, මුද්‍රණ යන්ත්‍රය, සුපරීක්ෂකය
ii. මූසිකය, යතුරු පුවරුව, මුද්‍රණ යන්ත්‍රය, ස්පීකරය
iii. මෙහෙයුම් යටිය, යතුරු පුවරුව, ස්පීකරය, සුපරීක්ෂකය
iv. මෙහෙයුම්යටිය, යතුරු පුවරුව, මූසිකය, සුපරීක්ෂකය

06. පරිගණකයක පිරිවිතර සලකා බැලීමේදී පහත කුමන සංරචකය වඩා **වැදගත් නොවේ ද**?

i. සකසනයේ ස්පන්ධ වේගය  ii. දෘඪ තැටියේ ධාරිතාව
iii. ප්‍රධාන මතකයේ ධාරිතාව  iv. පරිගණකයේ ප්‍රමාණය

07. "පරිශීලකයින් විශාල ප්‍රමාණයක්, පර්යන්ත විශාල ප්‍රමාණයක් යොදාගනිමින් එක් පරිගණකයකට සම්බන්ධ වෙමින් දත්ත සහ තොරතුරු හුවමාරු කිරීමත්, තැන්පත් කිරීම සහ නැවත ලබා ගැනීමත් සිදුකරයි "
ඉහත විස්තරයේ සඳහන් පරිගණකය කුමක් ද?

i. මහා පරිගණක (Mainframe computers)    ii. වැඩ පරිගණක (Work station computers)
iii. සුපිරි පරිගණක (Supper computers)    iv. ක්ෂුද්‍ර පරිගණක (Micro computers)

08. පරිගණකයේ ආරම්භක වැඩසටහන් වන POST සහ Bootstrap loader වැඩසටහන් ගබඩා කිරීම සඳහා පහත කුමන මතකය භාවිත කරයි ද?

i. සසම්භාවී ප්‍රවේශ මතකය (RAM)    ii. දෘඩ තැටි (Hard Disk)
iii. පාඨන මාත්‍ර මතකය (ROM)    iv. මතක රෙජිස්තර (Memory Registers)

09. පළමු පරම්පරාවේ පරිගණකවල දත්ත ආචයන මාධ්‍යක් ලෙස භාවිතා කරන ලද්දේ,
i. සංයුක්ත තැටි    ii. නම්‍යතැටි    iii. ප්‍රකාශ තැටි    iv. සිදුරුපත්

10. පරිගණකවල ප්‍රධාන දෘඩාංග තාක්ෂණය ලෙස......A......... අනුකලිත පරිපථ භාවිතා කළ අතර සිව්වන පරම්පරාවේ දී ............B............... භාවිතා විය. A හා B සඳහා වඩාත් ගැලපෙන පිළිතුර වන්නේ,

i. දෙවන පරම් පරාව, රික්තක නල    ii. දෙවන පරම්පරාව, ට්‍රාන්සිස්ටර්
iii. තෙවන පරම්පරාව, ක්ෂුද්‍ර සකසනය    iv. සිව්වන පරම්පරාව, ක්ෂුද්‍ර සකසනය

11. ගුණාත්මක තොරතුරක ලක්ෂණ අඩංගු පිළිතුර වන්නේ
i. ගුණාත්මක බව, අංගසම්පූර්ණ බව, නිවැරදි බව
ii. ගුණාත්මක බව, කාලීන බව, වෙහෙසක් නොදැනීම
iii. ගුණාත්මක බව, අංගසම්පූර්ණ බව, වේගය
iv. ගුණාත්මක බව, වේගය,වෙහෙසක් නොදැනීම

12. ..........A............... මගින් ශරීරයේ අභ්‍යන්තර කොටස්වල විස්තරාත්මක රූපසටහන් ලබාගත හැකි අතර .......B………… මගින් ශරීර අභ්‍යන්තරය ත්‍රිමාණ රූප ලෙස වෙන් වෙන් වශයෙන් ලබා ගත හැක. A හා B සඳහා වඩාත් ගැලපෙන පිළිතුර වන්නේ,
i. A - CAT යන්ත්‍රය B - MRI යන්ත්‍රය    ii. A - MRI යන්ත්‍රය B - CAT යන්ත්‍රය
iii. A - MRI යන්ත්‍රය B - ECG යන්ත්‍රය    iv. A - MRI යන්ත්‍රය B - EEG යන්ත්‍රය

13. මාර්ගගත සාප්පු සවාරියේ දී (online shopping) පාරිභෝගිකයින්ට අත්වන **අවාසියක්** වන්නේ,
i. පැය 24 ක් විවෘතව පැවතීම.    ii. භාණ්ඩය ස්පර්ශ නොවීම
iii. හරකාඩ් පත් මගින් මුදල් ගෙවීම සිදුවීම    iv. කැමති ස්ථානයක සිට භාණ්ඩ ඇනවුම් කලහැකි වීම

14. .................. පිරිවැයක් ඇති මුද්‍රණ යන්ත්‍රයක් ලෙස ...................... මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දිය හැකි වුවත් පිරිවැය............ ගුණාත්මක පිටපත් ලබා ගැනීම සඳහා ..........................මුද්‍රණ යන්ත්‍රය භාවිතා කල හැකිය.

i. වැඩි, තිත්න්‍යාස, අඩු , ලේසර්    ii. අඩු, තිත්න්‍යාස, වැඩි, ලේසර්
iii. වැඩි, ලේසර්, අඩු, තිත්න්‍යාස    iv. අඩු, ලේසර්, වැඩි, තිත්න්‍යාස

15. පරිගණක උපාංග සම්බන්ධ කිරීමේදී, යතුරු පුවරුව (Key board) ........(a)........ මගින්ද, පරිගණකයක් පරිගණක ජාලයට සම්බන්ධ කිරීම .......(b)........ මගින්ද, බහු මාධ්‍ය ප්‍රක්ෂේපකය (Multimedia Projector) සම්බන්ධ කිරීම .....(c)...... මගින්ද සිදු කරයි.

පහත සඳහන් පිළිතුරුවලින් a,b,c හිස් තැන්වලට පිළිවෙලින් ගැලපෙන වරණය තෝරන්න.

i. HDMI කෙවෙනිය, විශ්ව ශ්‍රේණිගත බස් කෙවෙනිය (USB port), RJ 45 කෙවෙනිය
ii. විශ්ව ශ්‍රේණිගත බස් කෙවෙනිය (USB port), RJ 45 කෙවෙනිය, HDMI කෙවෙනිය
iii. PS/2 කෙවෙනිය, විශ්ව ශ්‍රේණිගත බස් කෙවෙනිය (USB port), HDMI කෙවෙනිය
iv. HDMI කෙවෙනිය, RJ 45 කෙවෙනිය, වීඩියෝ කෙවෙනිය (Video port)

16. පරිගණකය සියළුම දෑ හඳුනාගනු ලබන්නේ,

i. අංක ලෙසය ii. අකුරු ලෙසය
iii. රූප ලෙසය iv. විද්‍යුත් සංඥා ලෙසය

17 83 දශමය (Decimal) සංඛ්‍යාව සඳහා තුල්‍යවන ද්වීමය (Binary) සංඛ්‍යාව පහත කවරක් ද?

i. $1000101_2$ ii. $1010011_2$ iii. $1010001_2$ iv. $1100001_2$

18. $10001_2$ මගින් දැක්වෙන දශමය සංඛ්‍යාව කුමක් ද?

i. 17 ii. 93 iii. 71 iv. 117

19. $11001_2$,$26_{10}$, $A_{16}$,$7_8$ යන සංඛ්‍යා ආරෝහණ පිළිවෙළින් සැකසූවිට නිවැරදි පිළිතුර කුමක්ද?

i. $7_8$, $A_{16}$, $11001_2$,$26_{10}$

ii. $7_8$, $A_{16}$, ,$26_{10}$, $11001_2$

iii. $A_{16}$, $7_8$, $11001_2$,$26_{10}$

iv. $7_8$, ,$26_{10}$, $11001_2$, $A_{16}$

20. A. 78 දශමය සංඛ්‍යාව $1001110_2$ ට තුල්‍ය වේ.
B. N හී ASCII කේතය දශමය78 අගයට සමාන වේ.
ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,

i. A පමණි
ii. B පමණි
iii. A සහ B දෙකම සත්‍ය වේ.
iv. A සහ B දෙකම අසත්‍ය වේ.

21. පරිගණකයක පරිශීලක ගිණුමක් විවෘත කිරීම සඳහා පරිශීලක නාමය සහ මුර පදය යන දෙකම නිවරදිව ඇතුලත් කළ යුතු වේ. මෙම අවශ්‍යතාව නිරූපනය වන්නේ පහත කුමන තර්කන ද්වාරය/ ද්වාර මගින්ද?

i. AND ද්වාරය මගිනි ii. OR ද්වාරය මගිනි
iii. NOT ද්වාරය මගිනි iv. AND හා NOT ද්වාර මගිනි

22. පහත දැක්වෙන සත්‍යතා වගුවේ X මගින් නිරූපනය වන බූලියානු ප්‍රකාශනය කුමක්ද?

| A | B | X |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 1 |

i. A.B ii. $(A+B)^{/}$ iii. A+B iv. $(A.B)^{/}$

23. A අනු ලක්ෂණය නිරූපණයට ASCII කේත මගින් $1000001_2$ ද්විමය අගය භාවිතා කරයි නම්, C අනු ලක්ෂණය නිරූපණයට භාවිතා වන ද්විමය සංඛ්‍යාව කුමක්ද?

i. 1000010 ii. 1000011 iii. 1100011 iv. 1100010

24 ලෝකයේ රටවල භාෂා විශාල ප්‍රමාණයක අනුලක්ෂණ නිරූපණය කිරීම සඳහා ............................ කේත ක්‍රමය භාවිත කරයි. හිස්තැනට සුදුසු වඩාත් නිවරදි පිළිතුර වන්නේ,

i. ASCII ii. BCD iii. UNICODE iv. EBCDIC

25 Windows මෙහෙයුම් පද්ධතියේ run විධානය තෝරා ඒ තුළ cmd ලෙස යතුරු ලියනය කලවිට පහත කවරක් සිදුවේද ?

i. දෝෂ පණිවිඩයක් ලැබේ
ii. cmd ලෙස ගොනු නාමය ඇති ගොනු සොයා දෙයි
iii. විධාන ප්‍රේරක කවුළුව (command prompt window ) විවෘත වේ
iv. කිසිවක් සිදු නොවේ

26. පරිගණක පද්ධතියක දෘඩාංග කොටස්වල ක්‍රියාකාරී සීඝ්‍රතාවය, තොරතුරුවල ප්‍රමාණය එහි අරමුණු හා තොරතුරු ගලායාමේ දිශාව ආදී කාර්යයන් කළමණාකරණය කරනු ලබන්නේ මෙහෙයුම් පද්ධතියක කුමන කාර්යය යටතේද?

i. මතක කළමනාකරණය
ii. ක්‍රියාවලි කළමනාකරණය
iii. උපාංග කළමනාකරණය
iv. ගොනු කළමනාකරණය

27 මෙහෙයුම් පද්ධතියක් (operating system) විස්තර කිරිමට යොදා ගත හැකි වඩාත්ම සුදුසු වචනය වන්නේ,

i. දෘඩාංග ( Hardware ) ii. ජීවිකාංග (Liveware)
iii. මෘදුකාංග (Software) iv. හවුල් අංග (Shareware)

28. යෙදවුම් මෘදුකාංගයක් සම්බන්ධයෙන් නිවැරදිව ප්‍රකාශය තෝරන්න.

i. දෘඩාංග අතර අන්තර් සම්බන්ධතාවයක් පැවැත්වීම.
ii. මෙහෙයුම් පද්ධතිය සුමටව පවත්වාගෙන යාම සඳහා උපකාර කිරීම.
iii. මෙහෙයුම් පද්ධතියක් මත ක්‍රියාත්මක වීම හා පරිශීලක අවශ්‍යතා පරිපූර්ණය කිරීම
iv. මිනිස් භාෂාවකට සමීප භාෂාවකින් ලියන ලද උපදෙස් යන්ත්‍ර භාෂාව බවට පරිවර්තනය කිරීම.

29. උපයෝගීතා වැසටහනක් ලෙස සැලකිය හැක්කේ

i. පංගු බෙදීම (Disk Partitioning) ii. පැතුරුම්පත් මෘදුකාංග (Spread Sheet Software)
iii. වදන් සැකසුම් මෘදුකාංග( Word Processing ) iv. දත්ත සමුදාය (Database)

30. චිත්‍රක පරිශීලක අතුරු මුහුණත් පමණක් අඩංගු වරණය තෝරන්න.

i. Dos, Windows, Ubuntu ii. Unix, Linux, Windows
iii. Mac OS, Windows, Dos iv. Linux, Windows, Mac OS

31. තල පරිගණක (Tablet PC) හා ජංගම දුරකථන (Smart Phone) වල භාවිතා කළ හැකි වදන් සැකසුම් මෘදුකාංගයක් වන්නේ,

i. Libre Office Writer ii. Libre Office Calc
iii. Office 365 Word iv. Document To Go

32 "Docx, Pdf, txt,Doc ගොණු නාම සහිත ගොනු ප්‍රවර්ග දැකිය හැකි වන්නේ,

i. වදන් සැකසුම් මෘදුකාංග ii. පද්ධති මෘදුකාංග
iii. ප්‍රතිවෛරස මෘදුකාංග iv. උපයෝගීතා මෘදුකාග

33 ඔබ සකසාගත් ලිපියක් මුද්‍රණය කරගැනීමට භාවිතා කල හැකි කෙටි මං යතුර වන්නේ,

i. Ctrl + C ii. Ctrl + V iii. Ctrl + P iv. Ctrl + M

34. සකස් කළ ලේඛනයක පෙර සිදුකළ පියවර සඳහා නැවත ගමන් කිරීමට (අලොප් කිරීම - Redo) සංයෝජනය කළ යුතු කෙටි මං යතුරකි,

i. Ctrl + R ii. Ctrl + Y iii. Ctrl + O iv. Ctrl + Z

35. "Good morning" යන වැකිය toggle case නම් අක්ෂර ආකෘතිකරණය කළ විට ලැබෙන ප්‍රතිදානය වන්නේ,

i. Good Morning
ii. GOOD MORNING
iii. good morning
iv. gOOD MORNING

36. වදන් සැකසුම් මෘදුකාංගයක් මඟින් පමණක් සිදු කළ හැකි කාර්යයකි.

i. තැපැල් මුසුව (Mail Merge)
ii. පිටපත් කිරීම (Copy)
iii. මුද්‍රණය කිරීම (Print)
iv. කැපීම (Cut)

37. වදන් සැකසුම් ලේඛනයක පිටු සැලැස්මට (page layout) අදාල පහත වගන්ති සලකා බලන්න.

a. පිටු මායිම ඉහල (TOP), පහළ (Bottom), වම (Left), දකුණ (Right), ලෙස හඳුන්වන් ලබයි.
b. ආලේඛය (Portrait) සහ භූදර්ශන (Landscape) යනු පිටු දිශානති ප්‍රරූප වේ.
c. කඩදාසිවල ප්‍රමාණය ( Page Size) සමහරක් A4, Latter, හා Legal ලෙස දැක්වේ.

ඉහත වගන්ති අතුරෙන් නිවරදි වන්නේ කුමක්ද?

i. A පමණි
ii. A සහ B පමණි
iii. A සහ C පමණි
iv.A, B සහ C සියල්ලම

38. පරිගණකයට අනවසර ප්‍රවේශ වන්නන්ගෙන් පරිගණක පද්ධතිය ආරක්ෂා කර ගත හැකි උපක්‍රමය නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,

i. ප්‍රති වෛරස මෘදුකාංගයක් ස්ථාපනය කිරීම
ii. මෘදු හෝ දෘඩ ගිණි පවුරක් ස්ථාපනය කිරීම
iii. සර්ජන ආරක්ෂකය සම්බන්ධ කිරීම
iv. අනවතර බල සැපයුම සම්බන්ධ කිරීම

39. අන්තර්ජාලය භාවිතා කිරීම නිසා සිදුවන අහිසි ප්‍රතිඵලයක් **නොවන්නේ,**

i. මාර්ගස්ථ පිළිසදරට (online chatting) ඇබ්බැහිවීම
ii. සමාජ වෙබ් අඩවි සඳහා ඇබ්බැහිවීම
iii. කොන්දේ කැක්කුම
iv. ද්වේශ සහගත මෘදුකාංග වල ආසාදනය

40. 3R සංකල්පය පහත කුමක් කළමනාකරණය කරයිද?

i. තොරතුරු තාක්ෂණය හා බැඳුනු සමාජීය ගැටලු
ii. තොරතුරු තාක්ෂණය හා බැඳුනු නෛතික ගැටලු
iii. තොරතුරු තාක්ෂණය හා බැඳුනු සදාචාරාත්මක ගැටලු
iv. තොරතුරු තාක්ෂණය හා බැඳුනු පාරිසරික ගැටලු

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| GIT | S | II |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 12 - 2019**

විභාග අංකය ............................ සාමාන්‍ය තොරතුරු තාක්ෂණය II කාලය පැය දෙකයි

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


01. a. පරිගණක පද්ධතියක් යනු කුමක්ද? (ලකුණු 3)

b. පරිගණකයෙහි විශේෂ ලක්ෂණ 2 ක් ලියන්න. (ලකුණු 1)

c. දත්තයක් පැවතිය හැකි ආකාර 02 ක් ලියන්න. (ලකුණු 1)

d. අද දිනයේ ලබා ගන්නා කාළගුණ වාර්තාව හෙට දිනයේ කාළගුණය තීරණය කිරීමට යෝග්‍ය නොවේ. ඉහත ප්‍රකාශනය ගුණාත්මක තොරතුරක කුමන ලක්ෂණයක් පැහැදිලි කරයිද ? (ලකුණු 1)

02. a. අදාන උපාංග හා ප්‍රතිදාන උපාංග අතර වෙනස ලියන්න. (ලකුණු 2)




b. ඉහත සටහනේ දැක්වෙන්නේ මධ්‍ය සැකසුම් ඒකකයෙහි දළ සටහනකි.

i. A සහ B නම් කරන්න. (ලකුණු 2)

ii. B හි කාර්යය කෙටියෙන් පහදන්න. (ලකුණු 2)

iii. මධ්‍ය සැකසුම් ඒකකය වෙත ඍජුවම දත්ත ලබාදීම සිදුවන්නේ කුමණ මතකයෙන්ද? (ලකුණු 1)

iv. පරිගණකයේ ආරම්භක වැඩසටහන (BIOS) ඇතුළත් මතකය කුමක්ද? (ලකුණු 1)

03 a. පරිගණකයේ දත්ත නිරූපණය සඳහා යොදා ගන්නා සංඛ්‍යා පද්ධති සහ කේත ක්‍රමවල තොරතුරු ඇතුළත් වගුවක් පහත දැක්වේ . එහි හිස්තැන් සඳහා අදාල නිවැරදි පිළිතුර අදාල ලේබලය සමඟ ලියන්න.(ලකුණු 10)

| **සංඛ්‍යා පද්ධති** | | | |
|---|---|---|---|
| **සංඛ්‍යා පද්ධතිය** | **පාදය** | **භාවිත වන ඉලක්කම්** | **උපරිම අගය** |
| ද්වීමය | 2 | ........**C**.......... | ...........**D**.......... |
| .......**A**............ | 10 | 0123456789 | 9 |
| ෂඩ් දශමය | .........**B**.......... | 0123456789ABCDEF | ..........**E**........... |
| **කේත ක්‍රම** | | | |
| කේත ක්‍රමය | බිට්ටු ගණන | අනුලක්ෂණ ප්‍රමාණය | නිරූපන |
| ASCII | .......... **F** ........... | 128 | ..........**G**........... |
| ..........**H**........... | 16 | 65536 | පාඨ<br>..........**I**...........<br>.........**J**........... |

| | | | |
|---|---|---|---|
| **A** | | **F** | |
| **B** | | **G** | |
| **C** | | **H** | |
| **D** | | **I** | |
| **E** | | **J** | |

04. පහත සංසිද්ධිය සලකා බලන්න.

ඔබට සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගයට අදාල අයදුම් පත්‍රය www.Gitonlineexam.com/GIT application.pdf යන අධිසන්දානය ඔස්සේ බාගත කර ගැනීමට අවකාශය ලබා දී ඇති අතර එය බාගත කරගත් පසු ඔබගේ පරිගණකයේ තිර අතුරු මුහුණතහි (desktop) විභාග අංකය ලෙස ලැබී ඇති GIT 2019 යන අංකය යොදා ෆෝල්ඩරයක් නිර්මාණය කර තැම්පත් කරගත යුතුව ඇත.

i. පරිගණක තිර අතුරු මුහුණතහි ෆෝල්ඩරයක් නිර්මාණය කරගැනීමට අදාල පියවර ලියන්න. (ලකුණු 1)

ii. එය GIT2019 යන අංකය යොදා නාමකරණය (Rename) කර ගැනීමට අදාල පියවර ලියන්න. (ලකුණු 1)

iii. ඔබ සකසා ගත් GIT2019 ෆෝල්ඩරය තුලට බාගත කරගත් තොරතුරු තාක්ෂණ අයදුම් පත්‍රය (GIT application.pdf) පිටපත් කරගැනීමට අදාල පියවර ලියා දක්වන්න. (ලකුණු 2)

iv. ඉහත iii පියවරයන්හි පිටපත් කිරීමට සහ ඇලවීමට ඔබට අනුගමනය කල හැකි කෙටිමං යතුරු ලියා දක්වන්න. (ලකුණු 2)

v. ඔබගේ Windows අතුරු මුහුණතෙහි Accessories හි ඇති "snipping" මෙවලම භාවිත කර, පරිගණක තිර අතුරු මුහුණතහි අනුරූපයක් (image) ලබාගෙන එය ඔබ සෑදූ GIT2019 ෆොල්ඩරයෙහි *Data.jpg* ලෙස සුරකීමට අදාල පියවර ලියා දක්වන්න. (ලකුණු 2)

05. ගෙදරක ප්‍රධාන දොරටුව මිනිස් කට හඬට සංවේදීව අයිති කරුගේ විධාන මත හෝ දුරස්ථ පාලකයක් මගින් විවෘත වේ.


- අයිතිතරු දෙන විධාන A ලෙසද, දුරස්ථ පාලකය මගින් ලබා දෙන විධාන B ලෙසද සලකන්න.

| | | |
|---|---|---|
| A | අයිතිකරු විධාන ලබා දීම | 1 |
| | අයිතිකරු විධාන ලබා නොදීම | 0 |
| B | දුරස්ථ පාලකය මගින් විධාන ලබා දීම | 1 |
| | දුරස්ථ පාලකය මගින් විධාන ලබා නොදීම | 0 |

i. දොර විවෘතවීමට අදාල සත්‍යතා වගුව පිටපත් කරගෙන Z ප්‍රතිදානය ලියන්න. (ලකුණු 4)

| A | B | Z |
|---|---|---|
| 0 | 0 | |
| 0 | 1 | |
| 1 | 0 | |
| 1 | 1 | |

ii. දොර විවෘතවීමට අදාල තාර්කික ද්වාරයේ නම ලියන්න (ලකුණු 2)





iii. A,B හා C ආදාන ලෙස ගෙන F හි බූලියානු ප්‍රකාශය ලියා දක්වන්න. (ලකුණු 2)

- F හි ප්‍රතිදානය 1 වීම සඳහා ආදානයන් A,B පිලිවෙළින් 1 ,0 ලෙස ද C ....... ද ලැබිය යුතු වේ.

iv. C හි ආදානය ලියන්න. (ලකුණු 1)

06. i. වදන් සැකසීමේ මෘදුකාංග භාවිත කරන අවස්තා 03ක් ලියන්න. (ලකුණු 03)

ii. පහත දැකවෙන වදන් සැකසීමේ මෘදුකාංගයක් භාවිතයෙන් සකස් කරන ලද සහතික පත්‍රය හා දී ඇති මෙවලම් ලැයිස්තුවභාවිතයෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



- මෙවලම් ලැයිස්තුව

| |
|---|
| Shapes, Bold, Italic, Underline, justify, Margins, Picture, Word Art, Drop Cap, Page Borders, Font face, superscript, columns, Thesaurus, Center |

- (සැලකිය යුතුයි - එක් මෙවලමක් එක් අවස්ථාවක් සඳහා භාවිත කළ යුතුයි. මෙවලම් එකකට වඩා භාවිත කර ඇත්නම් ලකුණු හිමි නොවේ.)

a. ඉහත A,B,C,D යන ඒවායින් පෙන්නුම් කරන දෑ එම ආකාරයෙන් හැඩසවි කිරීමට භාවිත කර ඇති මෙවලම් මොනවාද? (ලකුණු 04)

b. මෙහි E අක්ෂරයෙන් පෙන්වා ඇති දිනය $31^{st}$ ලෙස කිරීමට භාවිත කළ හැකි මෙවලම කුමක්ද? (ලකුණු 01)

c. මෙහි අක්ෂර පිටුව මැදට ලබා ගැනීමට භාවිත කර ඇති එකෙල්ල ක්‍රමය කුමක්ද? (ලකුණු 01)

07. a. ඔබගේ අධ්‍යාපනයට පන්ති කාමරයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගන්නා ආකාර දෙකක් ලියන්න. (ලකුණු 02)

b. විනෝදාස්වාදය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගන්නා අවස්ථා 2 ක් ලියන්න. (ලකුණු 02)

c. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පහසුකම් සැපයීම සඳහා රජය විසින් පිහිටුවා ඇති ආයතන දෙකක් ලියන්න. (ලකුණු 02)

d. පරිගණකයේ පරිණාමය අනුව නූතන පරම්පරාවේ පරිගණකවල සුවිශේෂිතා 2 ක් ලියන්න. (ලකුණු 02)

e. නූතන පරිගණකයේ නිර්මිතික ආකෘතිය කුමක්ද? (ලකුණු 02)

# උත්තර පත්‍රය
## පළමු වාර පරීක්ෂණය 2019
## සාමාන්‍ය තොරතුරු තාක්ෂණය
## General Information Technology

1 කොටස

| | | | |
|---|---|---|---|
| 1. iv | 11. i | 21. i | 31. iv |
| 2. i | 12. ii | 22. iii | 32. i |
| 3. iii | 13. ii | 23. ii | 33. iii |
| 4. i | 14. ii | 24. iii | 34. iv |
| 5. iv | 15. ii | 25. iii | 35. iv |
| 6. iv | 16. i | 26. iii | 36. i |
| 7. i | 17. ii | 27. iii | 37. iv |
| 8. iii | 18. i | 28. iii | 38. ii |
| 9. iv | 19. i | 29. i | 39. iii |
| 10.iii | 20. iii | 30. iv | 40. iv |

**11 කොටස**

01.

a. පද්ධතියක් යනු යම් කිසි කාර්යක් ඉටු කර ගැනීම සඳහා සංඝටක කිහිපයක් එකිනෙකට සම්බන්ධ ව ක්‍රියා කිරීමයි.

- පරිගණක පද්ධතියක් යනු දත්ත ලබා ගැනීමත්,ඒවා සකස් කිරීම සහ සුරැකීමත්, අවශ්‍ය වූ විට අවශ්‍ය තොරතුරු ලබා දීම සිදුකරන්නා වූ කාර්යය සමූහයේ එකතුවකි. (ලකුණු 3)

b. වේගය, නිරවද්‍යවීම, බහුකාර්ය බව,කාර්යක්ෂමතාව, වෙහෙසක් නොදැනීම ,සුරැකීමේ හා නැවත ලබා ගැනීමේ හැකියාව (ලකුණු 1)

a. අංක, අකුරු,රූප.ශබ්ද,අක්ෂරාංක (ලකුණු 1 )

b. කාලීන බව (ලකුණු 1 )

02.

පරිගණක පද්ධතිය වෙත දත්ත ලබා දෙන්නේ ආදාන උපක්‍රම මගින් වන අතර පරිගණක පද්ධතිය විසින් සකස් කරන ලද තොරතුරු පිටතට ලබා දෙන ආකාර ප්‍රතිදාන උපක්‍රම වේ. (ලකුණු 2 )

a.

i. A- මතක රෙජිස්තර B- අංක ගණිතමය හා තාර්කික ඒකකය (ලකුණු 2 )

ii. අංක ගණිතමය හා තාර්කික ඒකකය යනු සියලුම වර්ගයේ අංක ගණිතමය හා තාර්කික කටයුතු සිදුකරන ඒකකයයි. (ලකුණු 2 )

| | | | |
|---|---|---|---|
| **A** | දශමය | **F** | **7** |
| **B** | 16 | **G** | **පාඨ** |
| **C** | 0 1 | **H** | **යුනිකේත** |
| **D** | 1 | **I** | **රූප/ශබ්ද/ චලන රූප** |
| **E** | F | **J** | **රූප/ශබ්ද/** |

iii. ප්‍රධාන මතකය

| | | | චලන රූප |
|---|---|---|---|

මතකය/සසම්භාවී පිවිසුම්

(ලකුණු 1 )

iv. පඨන මාත්‍ර මතකය (ලකුණු 1 )

03.

a. (ලකුණු 10)

04.

i. පරිගණක තිරය මත Right click කරන්න →New→Folder තෝරන්න.
(Right click on the desktop→New→Folder) (ලකුණු 1)

ii. ෆෝල්ඩරය මත Right click කරන්න→rename→"GIT2019" ලෙස යතුරුලියනය කරන්න.
( Right click on the Folder→rename→ Type "GIT2019") (ලකුණු 1)

iii. Windows explore සංවාද කවුළුව විවෘත කරන්න→Downlord ෆෝල්ඩරය විවෘත කරන්න → GIT application.pdf ගොනුව තෝරා පිටපත් කරගන්න→ පරිගණක තිරය මත ඇති GIT2019 ෆෝල්ඩරය විවෘත කර අලවන්න

- අදාල නිවැරදි පිළිතුරු ද සලකන්න
(Windows explore→Downlord→select GIT application.pdf file →Copy→open Folder GIT2019→Past)
(ලකුණු 2)

iv. පිටපත් කිරීම:- Ctrl+C ඇලවීම :- Ctrl+V (ලකුණු 2)

v. Accessories හෝ search වෙතින් "Snipping" මෙවලම තෝරන්න→new→තිර අතුරු මුහුණතට අදාල කොටස තෝරන්න →*Picture.jpg* ලෙස GIT2019 ගොනුවේ සුරකින්න.
( Accessories or Search "Snipping" →new→Select the area of desktop→save as *Picture.jpg on Folder* GIT2019) (ලකුණු 2)

05. i (ලකුණු 4)

| A | B | Z |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 1 |

ii. OR තාර්කික ද්වාරය (ලකුණු 1) iii. $F= (A+B).C'$ (ලකුණු 2) iv.C = 0 (ලකුණු 1)

06.

i. ලිපි සකස් කිරීම ,ආරාධනා පත් නිර්මාණය, සහතික පත්‍ර නිර්මාණය, ලේබල් සකස් කිරීම පෝස්ටර් නිර්මාණය දැන්වීම් සහ සටහන් ආදී නිවැරදි පිළිතුරු (ලකුණු 3)

ii.

A- Picture (ලකුණු 4)

B-Font face C-Italic D-Page Borders

b. E- superscript (ලකුණු 1)

c. Center (ලකුණු 1)

07.

a. පරිගණක ආශ්‍රිත සමර්පන භාවිතය, පරීක්ෂණ සහිත වීඩියෝ දර්ශන භාවිත කිරීම, පරිගණක ඇසුරෙන් නිර්මාණ කිරීම (පිංතූරසහ වීඩියෝ සකස් කිරීම්), සඟරා, ලිපි, ලේඛන සකස් කිරීම සහ මුද්‍රණය කිරීම, අධ්‍යාපනික ක්‍රීඩා භාවිතය , CD-ROM මාධ්‍යයෙන් තොරතුරු අධ්‍යයනය, අන්තර්ජාලය ඔස්සේ අධ්‍යාපනික තොරතුරු රැස් කිරීම (ලකුණු 2)

b.

සමාජ ජාල සම්බන්ධතා, සංගීතයට සවන් දීම,පරිගණක ක්‍රීඩා, තොරතුරු තාක්ෂණය භාවිතයෙන් චිත්‍රපට නැරඹීම, ඩිජිටල් තාක්ෂණයෙන් යුතු රූපවාහිනී නැරඹීම, කැමරා භාවිතයෙන් පින්තූර ලබා ගැනීම, පුවත්පත් සහ ඉ - පොත්පත් කියවීම ,කැමරා භාවිතයෙන් පින්තූර ලබා ගැනීම (ලකුණු 2)

C. ICTA ආයතනය, නැණසල මධ්‍යස්ථාන, විදාතා මධ්‍යස්ථාන, CERT ආයතනය (ලකුණු 2)

d. අධිප්‍රමාණෙය් අනුකලිත පරිපථ භාවිතවය, නැනෝ තාක්ෂණික උපකරණ බිහිවීම, කෘතිම බුද්ධි පාදක උපකරණ බිහිවීම උපකරණ අධිප්‍රමාණෙයන් කුඩාවීම හා අදාල නිවැරදි පිළිතුරු ද සලකන්න (ලකුණු 2)

e. වොන් නියුමාන් ආකෘතිය (ලකුණු 1)